# සිනුවර සිංහල කෙටිනාට්‍ය උලෙළ

සිනුවර සිංහල කෙටිනාට්‍ය උලෙළ පසුගිය ඔක්තෝබර් 15 සෙනසුරාදා සවස් වරුවේ සිඩ්නි තදාසන්නයේ ඩියුරල් හි දී සාර්ථක තුන්වෙනිවරට පැවැත්වුණි. නිව් සවුත්වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ සහයෝගයෙන්, අනිල් ප්‍රනාන්දු සහ නිහාල් රූපසිංහ ගේ මූලිකත්වයෙන් සහ නාට්‍ය කලාවට ආදරය කරන පිරිසක ගේ සංවිධානත්වෙන් පැවැත්වුණු මේ උත්සවයට මෙවර කෙටි නාට්‍ය හයක් ඉදිරිපත් වී තිබුණි.

නිමල් වනිගසිංහ ගේ "ගිනි අවිය", ධනංජය කරුණාරත්න ගේ "චන්ද්‍රාවතී සමග රාත්‍රියක්", නිහාල් රූපසිංහ සහ තිලක් රණසිංහ ගේ "නොම් පෙන් ගේම්ස්", සිසිල් ෆොන්සේකා ගේ "මනුසත් උයන", ඉසුරු සමරසිංහ ගේ "ඇබෑර්තු ඇත" සහ ශ්‍රියාකාන්ති රණසිංහ ගේ "එල්ලිල මැරුණානෙ පොඩි නෝනෝ" ඒ නිර්මාණ විය. ඒ අතරින් ධනංජය කරුණාරත්න ගේ කෙටි නාට්‍යය ලංකාවේ තවමත් වේදිකා ගත වෙන ඔහුගේ නිර්මාණයේ සිනුවර නිෂ්පාදනයයි.

කෙටි නාට්‍ය අතර වේදිකාව සැකසෙන කාලයේ දී ප්‍රේක්ෂකයින් පිනවීමට පැරණි වේදිකා නාට්‍ය ගී ගායන ද, සජීවී සංගීතය සමග ඉදිරිපත් කෙරුණි. සිනුවර සිංහල කෙටි නාට්‍ය උලෙළේ අවස්ථා කීපයක ඡායාරූප මේ සමග පළවේ.

ඡායාරූප විජිත තල්පාවිල විසිනි.

















